කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලාව 2013

වාර්ෂික පරීක්ෂණය (2015 ඔක්තෝබර් - නොවැම්බර්)

ආර්ථිකවිද්‍යාව

ECON 53015/ ECON M 01 : උසස් ආර්ථික න්‍යාය ;සහ සූක්ෂම ආර්ථික විද්‍යාව

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 03 යි.

---

01. ඇඩම්ස්මිත්ට මුහුණදීමට සිදු වූ "වටිනාකම් පිළිබඳ ද්වෛධය", ගැටලුව විසඳීම සඳහා නව ආන්තිකවාදී ආර්ථික විද්‍යාඥයින් (Neo-marginal economists) විසින් ඉදිරිපත් කරන ලද විසඳුම විවේචනාත්මකව අගයන්න.

(ඇමුණුම 20)

02. x, y සහ z යන භාණ්ඩ වර්ග තුනක් පරිභෝජනය කරනු ලබන පාරිභෝගිකයෙකුගේ මුළු උපයෝගීතා ශ්‍රිත සහ පාරිභෝගිකයාගේ ආදායම මෙන්ම භාණ්ඩවල මිල ගණන් පහත පරිදි වේ.

$TU_x = 100Q_x - 10Q_x^2$

$TU_y = 200Q_y - 20Q_y^2$

$TU_z = 300Q_z - 30Q_z^2$

$Y =$ රු. 10000/= $P_x =$ රු. 5/=

$P_y =$ රු. 10/= $P_z =$ රු. 15/=

මෙම තොරතුරු ඇසුරින් ,

( අ ) පාරිභෝගිකයාගේ උපයෝගීතාව උපරිම කරගැනීම සඳහා ඔහු මිල දී ගන්නා භාණ්ඩ සංයෝගය කුමක්දැයි සොයන්න.

(ලකුණු 08)

( ආ ) අනෙකුත් සාධක ස්ථාවරව පැවතියදී Z භාණ්ඩයේ මිල රු.10 ක් දක්වා පහත වැටුනි නම් පාරිභෝගිකයා විසින් මිලදී ගනු ලබන භාණ්ඩ සංයෝගය කෙසේ වෙනස් වන්නේ දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

( ඉ ) අනෙකුත් සාධක ස්ථාවරව පැවතියදී මෙම පාරිභෝගිකයාගේ ආදායම රු.15000/= ක් දක්වා වැඩිවූයේ නම් පාරිභෝගිකයා විසින් මිලදී ගන්නා භාණ්ඩ සංයෝගය කුමක්දැයි සොයන්න.

(ලකුණු 04)

( ඊ ) මෙම භාණ්ඩ වර්ග තුනෙහි ස්වභාවය සම්බන්ධයෙන් ඔබට කිවහැක්කේ කුමක්ද?

(ලකුණු 03)

03. පාරිභෝගික හැසිරීම පිළිබඳව විග්‍රහ කෙරෙන සාම්ප්‍රදායික න්‍යායන්ට වඩා ලාක්ෂණික විග්‍රහය වඩා ප්‍රායෝගික න්‍යායක් වශයෙන් නිගමනය කළ හැකි ද ? අදහස් දක්වන්න.

(ලකුණු 20)

04. ( අ ) තොරතුරු අසමමිතිකතා ගැටලුව මගින් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කොට තොරතුරු අසමමිතිකතා ගැටලුව පිළිබඳව ආර්ථික විද්‍යාඥයෝ සැලකිලිමත් වන්නේ මන්දැයි විස්තර කරන්න.

(ලකුණු 06)

( ආ ) සැබෑ ලෝකයේ උදාහරණ භාවිතයෙන් "සදාචාර හානිය" සහ "අහිතකර තේරීම " යන ගැටලුවලට වෙළෙඳපොල ප්‍රතිචාර දක්වන්නේ කෙසේදැයි සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

( ඉ ) සැඟවුනු (නිරීක්ෂණය කළ නොහැකි) ලාක්ෂණිකයන් (hidden characteristics) මගින් මතු කෙරෙන ගැටලු සඳහා වන සුලභ විසඳුම් පිළිබඳ සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

05. ( අ ) උචිත රූප සටහන් භාවිතයෙන් ධන සහ ඍණ බාහිරතාවල බලපෑම ග්‍රහණය කරගැනීමට වෙළෙඳපොල යාන්ත්‍රණය අසමත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

( ආ ) " බාහිරතා සැලකිය යුතු විට සහ පෞද්ගලික විසඳුම් නොමැති විටෙක ගැටලුව විසඳීම සඳහා රජයට උත්සහ දැරිය හැකිය ". පැහැදිලි කරන්න.

(ලකුණු 10)

06. ( අ ) සිරකරුගේ උභතෝකෝටිකය ක්‍රීඩාවට සම්බන්ධ වන ක්‍රීඩකයින්ට "උභතෝකෝටිකයක් " වන්නේ මන්දැයි කල්පිත උදාහරණයක් ඇසුරෙන් විස්තර කරන්න. ක්‍රීඩාවට පූර්ව වශයෙන් සිදුකෙරෙන සාකච්ඡා මගින් ඔවුන්ට මෙම උභතෝකෝටිකය විසඳාගත හැක්කේ කෙසේද?

(ලකුණු 07)

( ආ ) නෑෂ් සමතුලිත සංකල්පය නිර්වචනය කරන්න. මෙම සංකල්පයේ වැදගත්කම සහ එය සැබෑ ලෝකයට අදාළ වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

( ඉ ) පහත ක්‍රීඩාව සලකන්න.

දෙවන තරගකරු

| | | X | Y | Z |
|---|---|---|---|---|
| | A | 3<br>3 | 1<br>4 | 2<br>2 |
| පළමුවන තරගකරු | B | 3<br>1 | 4<br>2 | 8<br>6 |
| | C | 4<br>2 | 6<br>3 | 0<br>7 |

ඉහත ක්‍රීඩාවේ නෑෂ් සමතුලිතය සොයන්න.

(ලකුණු 06)

07. ( අ ) නිෂ්පාදන ශ්‍රිතයක පැවතිය යුතු නව සම්භාව්‍ය ගුණාංග (Neo-classical properties) විස්තර කර ඒවායින් ඇතැම් ගුණාංග කොබ්-ඩග්ලස් නිෂ්පාදන ශ්‍රිතය තෘප්ත කරන බව සාධනය කරන්න.

(ලකුණු 15)

( ආ) යෙදවුමක මිල වෙනස්වීමේ ආදේශන සහ නිෂ්පාදන ප්‍රතිවිපාක විස්තර කරන්න. ශ්‍රමය (L) සහ ප්‍රාග්ධනය (K) යෙදවුම් වශයෙන් භාවිත කෙරෙන නිෂ්පාදන ක්‍රියාවලියක අනෙකුත් සාධක ස්ථාවරව පැවතියදී ශ්‍රම සාධකයේ මිල ($P_L$) අඩුවීමේ ආදේශන සහ නිෂ්පාදන ප්‍රතිවිපාක ප්‍රස්තාර භාවිතයෙන් වෙන්කර දක්වන්න.

(ලකුණු 10)

කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලාව 2013

වාර්ෂික පරීක්ෂණය (2015 ඔක්තෝබර් - නොවැම්බර්)

ආර්ථිකවිද්‍යාව

ECON 53025/ M 02 : උසස් ආර්ථික න්‍යාය : සාර්ව ආර්ථික විද්‍යාව

ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 03 යි.

---

01. සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පිළිබඳ සම්භාව්‍ය න්‍යායේ ප්‍රධාන නිගමන විවේචනාත්මකව විමසන්න.

02. " සඵල ඉල්ලුමේ ඌණතාවක් නිසා සේවා වියුක්තියක් ඇතිවේ. සේවා වියුක්තියට විසඳුම් වනුයේ සඵල ඉල්ලුමේ ඌණතාව ඉවත් වන පරිදි සමස්ත ඉල්ලුම වැඩි කිරීමයි ". මෙම ප්‍රකාශය මත පදනම් වී කේන්සියානු සේවා නියුක්ති න්‍යාය පැහැදිලි කොට එහි අදාළත්වය පිළිබඳ අදහස් දක්වන්න.

03. සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම සහ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මුල්‍යවාදීන්ගේ නිගමන සහ කේන්සියානු නිගමන සංසන්දනය කර විමසන්න.

04. එක්තරා ආර්ථිකයක් සම්බන්ධ සාර්ව ආර්ථික දත්ත කිහිපයක් පහතින් දැක්වේ. වටිනාකම රුපියල් දශ ලක්ෂවලින් ගණනය කර ඇති අතර පොළී අනුපාතය ප්‍රතිශතයක් වශයෙන් ගණනය කර ඇත.

| Y | C | r | I | $L_1$ | $L_2$ | M |
|---|---|---|---|---|---|---|
| 2000 | 1800 | 10 | 500 | 300 | 500 | 1000 |
| 2500 | 2200 | 20 | 300 | 500 | 300 | 1000 |

( අ ) IS-LM ශ්‍රිත ව්‍යුත්පන්න කර සමතුලිත පොළී අනුපාතය සහ සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.

(ලකුණු 07)

( ආ ) මෙම ආර්ථිකයට රජය මැදිහත් වී සියයට දහයක (10%) ආදායම් බද්දක් අයකර රුපියල් දශ ලක්ෂ 300 ක් වියදම් කරයි නම් සහ අයවැය හිඟයක් පවතී නම් විදේශීය ණය මගින් හිඟය පියවාගනී නම් සමතුලිත පොළී අනුපාතිකය සහ සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.

(ලකුණු 04)

( ඇ ) මෙම ආර්ථිකය විදේශීය ගනුදෙනුවලට සම්බන්ධ වූ පසුව ජාතික ආදායමින් සියයට විස්සක (20%) ආනයන වියදමක් සහ රුපියල් දශ ලක්ෂ 400 ක අපනයන ආදායමක් පවතී නම් සමතුලිතය කෙසේ වෙනස් වන්නේ ද?

(ලකුණු 03)

( ඈ ) විවෘත ආර්ථිකය සමතුලිත වන විට $S + Td + M = I + G + X$ සහ $L = M$ වන බව සනාථ කරන්න.

(ලකුණු 04)

( ඉ ) විවෘත ආර්ථිකයේ ජාතික ආදායම් ගුණකයේ අගය කොපමණ ද?

(ලකුණු 02)

05. උද්ධමනය හා සේවා වියුක්තිය එකවර ඇතිවිය නොහැකිය යන කේන්ස්වාදී නිගමනය පිලිප්ස් වක්‍ර විග්‍රහය ආශ්‍රිතව පැහැදිලි කොට දිගුකාලීන පිලිප්ස් වක්‍රය කෙටිකාලීන පිලිප්ස් වක්‍රයෙන් වෙනස්වන ආකාරය පිළිබඳ අදහස් දක්වන්න.

06. ( අ ) අභ්‍යන්තර සහ බාහිර තුලනයක් මගින් අර්ථ ක්‍රමයක් සාර්ව ආර්ථික සමතුලිතයක් කරා කෙසේ ළඟා වන්නේද යන්න උචිත රූප සටහන් භාවිතයෙන් විස්තර කරන්න.

(ලකුණු 12)

( ආ ) ගෝලීය තිරසාරත්වය උදෙසා පාරසරික තුලනයේ කාර්යයභාරය සහ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

07. ( අ ) විවිධ පරිභෝජන ආකෘති පිළිබඳ හරස්කඩ දත්ත සහ කාල ශ්‍රේණි දත්ත භාවිතයෙන් කරන ලද ප්‍රත්‍යයක අධ්‍යයනවල ප්‍රතිඵල පරීක්ෂා කරන්න.

(ලකුණු 12)

( ආ ) කේන්සියානු පරිභෝජන න්‍යාය විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

(ලකුණු 08)

කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලාව 2013

වාර්ෂික පරීක්ෂණය (2015 ඔක්තෝබර් - නොවැම්බර්)

ආර්ථිකවිද්‍යාව

ECON 53035/ ECON M 03 : **ගණිතය සහ සංඛ්‍යානය**

**එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරාගෙන**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

I කොටස

01. (අ) එක්තරා භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ මුළු පිරිවැය $TC = \frac{1}{4}x^2 + 35x + 25$ ද භාණ්ඩයේ මිල $P = 500 - \frac{1}{2}X$ ද වේ.

i. ලාභ උපරිම කෙරෙන නිමැවුම් මට්ටම සොයන්න. (ලකුණු 04)

ii. මේ නිමැවුම් මට්ටමේදී සාමාන්‍ය පිරිවැය අවම වන බව පෙන්වන්න. (ලකුණු 04)

(ආ) ඒකාධිකාරියකුගේ ඉල්ලුම් (Q) හා සාමාන්‍ය පිරිවැය (AC) ශ්‍රිත පිළිවෙලින් පහත දැක්වෙන පරිදි වේ.

$$Q = 400 - 20P$$
$$AC = 5 + Q/50$$

i. ලාභ උපරිම කෙරෙන විකුණුම් මට්ටම සොයන්න. මේ විකුණුම් මට්ටමේදී දෙවැනි සණයේ කොන්දේසි තෘප්ත වන බව පෙන්වන්න.

(ලකුණු 06)

ii. නිෂ්පාදිතයේ මිල කුමක් ද? (ලකුණු 03)

iii. ආයතනයේ ලාභ ගණනය කරන්න. (ලකුණු 03)

02. ( අ ) රටක ආන්තික ඉතුරුම් ශ්‍රිතය $S'(Y) = 0.3 - 0.1Y^{-1/2}$ පරිදි වේ. ආදායම (Y) 81 වන විට සමාහාර ඉතුරුම් ශුන්‍ය වේ නම් රටේ ඉතුරුම් ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න.

(ලකුණු 07)

( ආ ) පුද්ගලයකුගේ උපයෝගිතා ශ්‍රිතය $U = U(x_1, x_2) = (x_1 + 2)^2 (x_2 + 3)^3$ ආකාර ගනී. මෙහි U යනු මුළු උපයෝගීතාව ද $x_1$ හා $x_2$ යනු භාණ්ඩ දෙකෙන් පරිභෝජනය කරන ප්‍රමාණ ද වේ.

i. භාණ්ඩ දෙකෙහි ආන්තික උපයෝගිතා ශ්‍රිත සොයන්න. (ලකුණු 04)

ii. භාණ්ඩ දෙකෙන්ම ඒකක තුන (03) බැගින් පරිභෝජනය කරන විට දෙවැනි භාණ්ඩයේ ආන්තික උපයෝගීතාව සොයන්න.

(ලකුණු 04)

( ඇ ) නිෂ්පාදිතයක ආන්තික පිරිවැය ශ්‍රිතය $f(x) = 3X + 4X^2 + 5X^3 + C$ වේ. නිමැවුම ශුන්‍ය වන විට මුළු පිරිවැය 100 නම් මුළු පිරිවැය ශ්‍රිතය සොයන්න.

(ලකුණු 05)

03. පහත දැක්වෙන ජාතික ආදායම් නිර්ණන ආකෘතිය සලකන්න.

$$Y - C = I + G$$

$$-bY + C + bT = 0$$

$$-tY + T = 0$$

( ඇ ) ඉහත රේඛීය සම්බන්ධතාව න්‍යාස ඇසුරින් ප්‍රකාශ කරන්න. (ලකුණු 05)

( ආ ) $t = 0.2$ $b = 0.8$ $I = 75$ හා $G = 25$ නම් ක්‍රැමර්ගේ නීතිය මගින් Y, C හා T හි සමතුලිත අගයන් සොයන්න.

(ලකුණු 15)

( ඇ ) සංරෝධක සහිත ප්‍රශස්ථකරණය හා සම්බන්ධ ක්‍රියාවලිය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

( ආ ) කිසියම් නිෂ්පාදනයක් සඳහා වන නිෂ්පාදන ශ්‍රිතය $Q = 15 L^{0.4} K^{0.6}$ ලෙස දී ඇත. මෙහි L යනු ශ්‍රම ඒකක ප්‍රමාණය සහ K යනු ප්‍රාග්ධන ඒකක ප්‍රමාණය වේ. සෑම ශ්‍රම ඒකකයකම මිල රුපියල් 10 ක් ද ප්‍රාග්ධන ඒකකයක මිල රුපියල් 8 ක් ද වේ. නිෂ්පාදන සමාගමට ශ්‍රමය හා ප්‍රාග්ධනය විෂයෙහි රුපියල් 200 ක් වැය කළ හැකි නම් සමාගමට නිෂ්පාදනය කළ හැකි උපරිම නිමැවුම් මට්ටම සොයන්න.

(ලකුණු 15)

## II කොටස

i. X නැමති සන්තත සසම්භාවී විචල්‍යයේ සම්භාවිතා ඝණත්ව ශ්‍රිතය (PDF) පහත දැක්වේ.

$$f(X) = (2X)^2 \qquad 0 \le X \le 1$$

$P(X \le K) = P(X > K)$ සහ $P(X > \alpha) = 0.1$ වන විට

(අ) K සහ (ලකුණු 04)

(ආ) $\alpha$ සොයන්න. (ලකුණු 04)

ii. උපාධිධාරීන් 8 දෙනෙකු සහ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු අතුරින් 5 දෙනෙකුගෙන් යුත් අධ්‍යයන කමිටුවක් පත් කිරීමට අවශ්‍යව ඇත. අධ්‍යයන කමිටුව තුළ,

( අ ) හරියටම කථිකාචාර්යවරු දෙදෙනෙකු (ලකුණු 02)

( ආ ) අවම වශයෙන් එක් උපාධිධාරියෙකු සිටීමේ සම්භාවිතාව කුමක් ද?

(ලකුණු 02)

iii. පැන් නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවක X, Y, Z නැමති යන්ත්‍ර 3 කින් පිළිවෙලින් 35%, 45% සහ 20% බැගින් පැන් නිෂ්පාදනය කරයි. එම නිෂ්පාදනයන්ගෙන් පිළිවෙලින් 3%, 2% සහ 5% බැගින් දෝෂ සහිත වේ. සසම්භාවීව පෑනක් තෝරා ගත් විට එය දෝෂ සහිත එකක් නම්, එය

( අ ) Y හෝ Z යන්ත්‍රයෙන් නිෂ්පාදනය කළ එකක් වීමේ සම්භාවිතාව කුමක් ද?

(ලකුණු 02)

( ආ ) ඉහත iii හි තොරතුරු භාවිත කරමින් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| සිද්ධිය | පූර්ව සම්භාවිතාව | අසම්භාව්‍ය සම්භාවිතාව | බද්ධ සම්භාවිතාව | සංශෝධිත සම්භාවිතාව |
|---|---|---|---|---|
| X | | | | |
| Y | | | | |
| Z | | | | |
| එකතුව | | | | |

(ලකුණු 06)

06. ( i ) කාසි 1000 ක් උඩ දැමීමෙන් ලැබුණු මධ්‍යනාෳ සිරස ප්‍රමාණය 500 ක් හා සම්මත අපගමනය සිරස ප්‍රමාණය 15.81 ක් විය. මෙම තොරතුරු භාවිත කර සිරස ප්‍රමාණය 460 - 520 අතර වීමේ සහ සිරස ප්‍රමාණය 510 ට අඩු වීමේ සම්භාවිතාව ගණනය කරන්න.

(ලකුණු 04)

( ii ) එක්තරා රථවාහන සමාගමක් සතුව මෝටර් රථ 15 ක් කුලියට දීමට ඇත. මෙයින් මෝටර් රථ 10 ක් දෛනිකව පාරිභෝගිකයන්ට කුලියට දෙනු ලබයි. මෝටර් රථ පොයිසෝන් ව්‍යාප්තියක පිහිටන අතර මධ්‍යනාෳය 4 කි. මෙම තොරතුරු භාවිත කර දිනකට මෝටර් රථ 10 ක් සහ 11 ක් ඉල්ලුම් කිරීමේ සම්භාවිතාවන් ගණනය කරන්න.

(ලකුණු 04)

(iii) යම්කිසි ගුවන් සමාගමක් තමාගේ අත්දැකීම්වලට අනුව ගුවන් යානා වෙන් කරන ලද සියලුම මගීන් ගුවන් යානයේ ගමන් කිරීමට නොපැමිණෙන බව දනී. ඒ අනුව ආසන වෙන් කරන මගීන්ගේ පැමිණීමේ සම්භාවිතාව 0.8 ක් වේ. මෙය ද්විපද ව්‍යාප්තියක් ගන්නා අතර මෙම තොරතුරු භාවිත කර ගුවන් යානය සියලුම මගීන් සහිතව පිටත්වීම සහ අඩු වශයෙන් ආසන 2 ක් වත් හිස්ව ගුවන් යානය පිටත්වීමේ සම්භාවිතාවන් ගණනය කරන්න. ගුවන් යානයේ ආසන සංඛ්‍යාව 10 කි.

(ලකුණු 04)

(iv) බෑගයක සුදු බෝල 4 ක් හා රතු බෝල 6 ක් ඇති අතර එයින් සසම්භාවීව බෝල 3 ක් ඉවතට ගනු ලැබේ.

(අ) සුදු බෝලයක් ලැබීමේ අපේක්ෂිත අගය සොයන්න.

(ලකුණු 04)

(ආ) ලැබෙන සෑම සුදු බෝලයකටම රුපියල් 4 ක හා සෑම රතු බෝලයකටම රුපියල් 6 ක ත්‍යාග මුදලක් ලැබේ නම් අපේක්ෂිත ත්‍යාග මුදල සොයන්න.

(ලකුණු 04)

07. i. x යන සසම්භාවී විචල්‍යයට $a = 210$ සහ $b = 260$ සහිත ඒකාකාර ව්‍යාප්තියක් ඇති බව උපකල්පනය කරන්න. ඒ අනුව,

(අ) $p(215 \leq X \leq 230)$ සොයන්න. (ලකුණු 04)

(ආ) මෙම ව්‍යාප්තියේ 40 වෙනි ප්‍රතිශතකයේ දායකත්වය කුමක් ද? (ලකුණු 04)

ii. $X_1$ යනු මධ්‍යන්‍යය 2 ක් සහ විචලතාව 3 ක් වූ ප්‍රමත සසම්භාවී විචල්‍යයක්ද, $X_2$ යනු මධ්‍යන්‍යය 1 ක් සහ විචලතාව 4 ක් වූ ප්‍රමත සසම්භාවී විචල්‍යයක්ද වේ. $X_1$ සහ $X_2$ ස්වායත්ත යැයි උපකල්පනය කරන්න. ඒ අනුව $Y = 2X_1 + 3X_2 - 2$ යන රේඛීය සංයෝජනයේ ව්‍යාප්තිය සොයන්න.

(ලකුණු 07)

iii. $C = \frac{9}{10}$ නම් පහත සඳහන් ශ්‍රිතය සන්තත සම්භාවිතා ඝණත්ව ශ්‍රිතයක අවශ්‍යතා සම්පූර්ණ කරයිද යන්න තහවුරු කරන්න.

$$f(x, y) = Cxy^2 + \frac{1}{5}$$

$0 \leq x \leq 2$ වන විට හා $0 \leq y \leq 1$ වන විට (ලකුණු 05)

08. ( i ) තේ මත පනවන ලද බදු ඉහළ දැමීමට පෙර පුද්ගලයින් 500 ක නියැදියකින් 400 ක් තේ පානය කරන බවත්, බදු ඉහළ දැමීමෙන් පසු පුද්ගලයින් 600 ක නියැදියකින් 400 ක් තේ පානය කරන බවත් සොයාගෙන ඇත.

( අ ) සමානුපාතයේ සම්මත දෝෂය ඇසුරින් තේ පරිභෝජනයේ සැලකිය යුතු අඩුවීමක් පවතී දැයි $\alpha = 0.01$ මට්ටමින් පරීක්ෂා කරන්න. (ලකුණු 04)

( ආ ) සංගහන සමානුපාතය සඳහා 95% විශ්‍රම්භ ප්‍රාන්තරයක් ගොඩනගන්න. (ලකුණු 02)

( ii ) තරම 16 ක් වූ සසම්භාවී නියැදියක මධ්‍යන්‍යය 53 ක් වන අතර මධ්‍යන්‍ය අපගමනයන්ගේ වර්ගයන්ගේ ඓක්‍යය $[\sum(X - \bar{X})^2]$ 150 කි.

( අ ) මෙම නියැදිය මධ්‍යන්‍යය 56 ක් වන සංගහනයකින් ලබාගත් බවට සැලකිය හැකි ද? ( $\alpha = 0.05$ ) (ලකුණු 03)

( ආ ) සංගහන මධ්‍යන්‍යය සඳහා 99% විශ්‍රම්භ ප්‍රාන්තරයක් ලබාගන්න. (ලකුණු 02)

( iii ) පහත සඳහන් මාතෘකා පැහැදිලි කරන්න.

( අ ) කල්පිත පරීක්ෂාවක වැදගත්කම (ලකුණු 03)
( ආ ) කල්පිතයක් පරීක්ෂා කිරීමේ ක්‍රියා පිළිවෙල (ලකුණු 02)
( ඇ ) ඒක අංශ පරීක්ෂාව හා ද්වි අංශ පරීක්ෂාව (ලකුණු 02)
( ඈ ) අවධි පෙදෙස සහ අවධි අගය (ලකුණු 02)

කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලාව 2013

වාර්ෂික පරීක්ෂණය (2015 ඔක්තෝබර් - නොවැම්බර්)

ආර්ථිකවිද්‍යාව

ECON 53045/ M 04 : ආර්ථික චින්තනය වර්ධනය සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය

**එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

I කොටස

01. ඇඩම් ස්මිත්ගේ රාජ්‍ය නිර්බාධවාදය වාණිජවාදී විග්‍රහයන් නිශේධනය කිරීම සඳහා කවරාකාරයෙන් බලපෑවේද යන්න විග්‍රහ කරන්න.

02. මාක්ස්වාදී ආර්ථික චින්තනයේ ප්‍රායෝගිකත්වය, එහි ව්‍යාප්තිය කෙරෙහි සිදුකළ දායකත්වය ඇගයීමක් කරන්න.

03. "සමාජවාදී දේශපාලන ක්‍රමයක් තුළ ධනවාදී ආර්ථික න්‍යායන් ක්‍රියාත්මක කිරීම ඩෙන්ෂියාවෝ පිං ගේ සාර්ථකත්වයට හේතු විය". විග්‍රහ කරන්න.

04. "ජෝන් මෙනාඩ් කේන්ස් ධනවාදී ආර්ථික න්‍යායන් හා සමාජවාදී ආර්ථික න්‍යායන් අතර මධ්‍යස්ථ ආර්ථික මතවාදයක් ගොඩනගන ලදි ". විමසන්න.

## II කොටස

05. ඩබ්. ඩබ්. රොස්ටොව් විසින් ඉදිරිපත් කරන ලද ආර්ථික වෘද්ධියේ අදියර පිළිබඳ මාදිලිය තුළින් විස්තර කෙරෙන අදහස් නූතන ආර්ථික ක්‍රමයන්හි ගමන් මාර්ගය පිළිබඳව කෙතරම් යථාර්ථවාදී ප්‍රවේශයක් වන්නේ ද විමසන්න.

06. හැරඩ් - ඩූමා ආකෘතිය කුමක්දැයි විස්තර කොට ඒ තුළින් සංවර්ධනය වන රටවලට ගත හැකි ආර්ථික උපාය මාර්ග කෙතරම් ප්‍රායෝගික විය හැකි ද යන්න විමර්ශනය කරන්න.

07. දරිද්‍රතාව පිටුදැකීම සඳහා මෑතකාලීනව හඳුන්වා දෙනු ලැබූ රාජ්‍ය වැඩසටහන් හඳුන්වා, ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම අවම කිරීම සඳහා ඒවායේ සාර්ථක හා අසාර්ථකතාවන් පිළිබඳ විග්‍රහ කරන්න.

08. විදේශීය සෘජු ආයෝජන ප්‍රවර්ධනයෙහිලා 1977 න් පසුව ශ්‍රී ලංකාව අනුගමනය කළ උපාය මාර්ග අගයමින් විදේශීය සෘජු ආයෝජන ගලා ඒමේ නව ප්‍රවනතා පිළිබඳව විමසීමක් කරන්න.